සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - ඌව පළාත

**DEPARTMENT OF HEALTH SERVICES - UVA PROVINCE**

சுகாதார சேவைத் திணைக்களம் -ஊவா மாகாணம்

අංක 301 ආර් එච් ගුණවර්ධන මාවත - බදුල්ල # 301, R.H. Gunawardana Mawatha, Badulla.


මගේ අංකය / My No. UH/FI/01/01/2026/2027 ඔබේ අංකය / Your No. .................... දිනය / Date 2026.07.06

කළමනාකරු,

.................................

.................................

<u>ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි</u>

**<u>වෙළඳපොළ මිළ සැසඳුම් ක්‍රමය යටතේ මිළ ගණන් කැඳවීම</u>**

**<u>මහියංගණ මූලික රෝහල වෙත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම - ප්‍රසම්පාදන අංකය- PDHS/CHEM/2026</u>**

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහියංගණ මූලික රෝහල වෙත ඉදිරි මාස 05 කාලය සඳහා පිරිසිදු කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා 2026 වර්ෂය සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යලයෙහි ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්/ අදාළ සේවා සපයනු ලබන ආයතනවෙතින් පහත සඳහන් පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මුද්‍ර තැබූ මිළ ගණන් මෙයින් කැඳවනු ලැබේ.

| අනු අංකය | අවශ්‍ය රසායනික ද්‍රව්‍ය නාමය | ඒකකය | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිල රු: | මුළු වටිනාකම (VAT රහිත) රු: |
|---|---|---|---|---|---|
| 1 | | | | | |

ඇමුණුම් ලිපි අංක 01 හි අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා උපකරණ විස්තර දක්වා ඇත. ඇමුණුම් ලිපි අංක 02 මගින් අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හා උපකරණවල පිරිවිතර අවශ්‍යතා දක්වා ඇත.

02. **සුදුසුකම් :** ලංසුකරුවන් 2026 කාර්යාලීය සනීපාරක්ෂක ද්‍රව්‍ය සැපයීම සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම් කාර්යලයෙහි 2026 වර්ෂය සඳහා ලියාපදිංචි වූ/ අදාළ සේවාවන් සපයනු ලබන වලංගු ව්‍යාපාර ලියාපදිංචියක් සහිත සැපයුම්කරුවෙකු හෝ ආයතනයක් විය යුතුය.

03. **ලංසු ලියවිලි ලබා ගැනීම.:** 2026.07.07 දින සිට 2026.07.20 දින ප.ව. 3.00 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන **healthdept.up.gov.lk** වෙත පිවිස, Downloads, Procurement Notice වෙත පිවිසීමෙන් බාගත කර ගත හැකිය.

04. **ලංසු භාර දීම :** නිසි පරිදි සම්පූර්ණ කර, ඔබගේ මිල ගණන් ලිපි කවරයක බහා වම්පස ඉහල කෙලවරේ **"මහියංගණ මූලික රෝහල වෙත පිරිසිදු කිරීමේ රසායනික ද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් - 2026"** යනුවෙන් සඳහන් කර 2026.07.21 දින පෙ.ව.10.30 ට පෙර **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, අංක 301, ආර්.එච්.ගුණවර්ධන මාවත, බදුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ

මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලන මෙන් කාරුණිකව දන්වා සිටිමි. (සම්පූර්ණ කළ ඇමුණුම් අංක 01-05 දක්වා වූ ආකෘති හා ඉල්ලා ඇති අනෙකුත් ලේඛන ද මේ සමග එවිය යුතුය)

05. **ලංසු ඇපය :** මේ සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව නිකුත් කර ඇති ප්‍රසම්පාදන අත්පොත - 2024 හි 5.9 (ඉ) ඡේදයට අදාළව ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. එකී ප්‍රකාශය ලබා දිය යුතු ආකෘතිය ඇමුණුම් අංක 05 ලෙස ලංසු ලියවිලිවල අමුණා ඇත.

06. **ලංසු විවෘත කිරීම :** නියමිත දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් විවෘත කිරිම 2026.07.21 දින පෙ.ව 11.00 ට ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරයේදී සිදු කරනු ලැබේ. ඒ සඳහා ලංසු ඉදිරිපත් කළ පුද්ගලයන්ට හෝ ලංසු ඉදිරිපත් කළ ආයතනයන්හි ලිඛිතව බලයලත් නියෝජිතයන්හට තම අනන්‍යතාව සනාථ කර සහභාගී විය හැකිය.

07. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් කිසිදු හේතුවක් නොදන්වා සියලුම ලංසු හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

විශේෂඥ වෛද්‍ය
ඩබ්ලිව්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න
MBBS.MSC,MD Medical Adiministration
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - බදුල්ල

විශේෂඥ වෛද්‍ය ඩබ්.ආර්.එම්. මහේන්ද්‍ර සෙනෙවිරත්න.
ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.